# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2133/5 - 2019 ජූලි මස 22 වැනි සඳුදා - 2019.07.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන වැඩ බලන අමාත්‍ය, ලකී ජයවර්ධන වන මම, එකී මණ්ඩලයට අඟුණකොලපැලැස්ස නව බන්ධනාගාරයට පානීය ජලය සැපයීමට අම්බලන්තොට ලවණ බාධකයේ දකුණු ඉවුරේ සිට පුහුල්යාය පාරට පිවිසීම දක්වා ජල නල එලීම හා ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩම් කොටස් 03 ක් අත්කර ගැනීමට අවශ්‍යවී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටස් තුනේහි නිශ්චල දේපළ අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

ලකී ජයවර්ධන,
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන
වැඩ බලන අමාත්‍ය.

2019 ජූලි මස 05 වැනි දින,
අංක 35, ලක්දිය මැදුර,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1480

**උපලේඛනය**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 146 පුහුල්යාය ග්‍රාම නිලධාරී වසමේ පවාලුවිල ගමේ පිහිටි පර්චස් 12 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස් තුන.

01. කැබලි අක්ෂර A - ප්‍රමාණය පර්චස් 2 ක් පමණ

| | | |
|---|---|---|
| *උතුරට* | : | කේ. එම්. කමලාවති මිය හිමිකම් කියන ඉඩම සහ කැබලි අක්ෂර B කොටස ; |
| *නැගෙනහිරට* | : | ආරක්ෂක බැම්ම ; |
| *දකුණට* | : | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හිමිකම් කියන ලවණ බාධක ඉඩම, ආරක්ෂක බැම්ම හා වලවේ ගඟ ; |
| *බටහිරට* | : | ශාමිලා ශ්‍රිවන්ති මිය හිමිකම් කියන ඉඩම. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : කේ. ශාමිලා ශ්‍රිවන්ති මිය,
පුහුල්යාය පාර, අම්බලන්තොට.

1A - G 30544 — 28 (2019/07)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

02. කැබලි අක්ෂර B - ප්‍රමාණය පර්චස් 3 ක් පමණ

| | | |
|---|---|---|
| *උතුරට* | : | කේ. එම්. මල්ලිකා මිය හිමිකම් කියන ඉඩම සහ කැබලි අක්ෂර C කොටස ; |
| *නැගෙනහිරට* | : | ආරක්ෂක බැම්ම ; |
| *දකුණට* | : | ආරක්ෂක බැම්ම සහ වලවේ ගඟ ; |
| *බටහිරට* | : | කේ. එම්. කමලාවති මිය හිමිකම් කියන ඉඩම. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : කේ. එම්. කමලාවති මිය,
පුහුල්යාය පාර, අම්බලන්තොට.

03. කැබලි අක්ෂර C - ප්‍රමාණය පර්චස් 7 ක් පමණ

| | | |
|---|---|---|
| *උතුරට* | : | කේ. එම්. මල්ලිකා මිය හිමිකම් කියන ඉඩම සහ ගඟබඩ පාර ; |
| *නැගෙනහිරට* | : | ආරක්ෂක බැම්ම සහ වලවේ ගඟ ; |
| *දකුණට* | : | ආරක්ෂක බැම්ම, වලවේ ගඟ සහ කැබලි අක්ෂර B ඉඩම ; |
| *බටහිරට* | : | කේ. එම්. මල්ලිකා මිය හිමිකම් කියන ඉඩම. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : කේ. එම්. මල්ලිකා මිය,
පුහුල්යාය පාර, අම්බලන්තොට.

08 - 205

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.